SPMC

# රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## ඖෂධ නිෂ්පාදනය, සැපයීම සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයංගාමක, වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවලුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමඟ අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

***සෑම අයදුම්කරුවෙකුම,***

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. තනතුරේ වගකීම් නිසිලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

### 01. කළමනාකරු - නිෂ්පාදන (MM 1-1- II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂයකයින්**

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් ස්වභාවික විද්‍යා, ඖෂධවේදය හෝ ඉංජිනේරු යන විෂය ධාරාවකින් ලබාගත් ප්‍රථම උපාධියක්.

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් වෙනත් සමාන අන්දමින් ප්‍රථම උපාධියක්.

(ආ) පරිගණක සාක්ෂරතාව (Literacy)

සහ

(ඇ) ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළ අවම වශයෙන් වසර පහක (05) ක පශ්චාත් පළපුරුද්ද

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

01. බාහිර අපේක්ෂකයින් හට අදාළ වන සුදුසුකම් ලබා තිබීම.

හෝ

02. තනතුරට අදාළවන විෂය ක්ෂේත්‍රයක කනිෂ්ඨ කළමනාකරු වර්ගීකරණයේ (JM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** : MM 1-1 – 2016 - රු 53,175/= 10x1,375/=15x1,910/= - 95,575/= (ඉහත සඳහන් වැටුපට අමතරව රජය විසින් අනුමත කර ඇති දීමනාද ගෙවනු ලැබේ)

**වයස** : වයස අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අපේක්ෂයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය** : ලිඛිත තරගකාරී විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

### 02. රසායනඥ තනතුර (JM 1-1) II වන ශ්‍රේණිය

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) රසායන විද්‍යාව ඇතුළු විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ රසායන විද්‍යාව හෝ ඖෂධ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සමාන සුදුසුකම්.

සහ

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ඖෂධ සූත්‍රකරණය / නිෂ්පාදන ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් පළපුරුද්ද.

**සටහන** : විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව සහ පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

### 03. අභ්‍යන්තර විගණක නිලධාරී තනතුර (JM 1-1) II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) (01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණය හෝ වාණිජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ සමාන සුදුසුකම්.

හෝ

(02) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICSAL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් සහ ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) අන්තර් මධ්‍යම හෝ වෘත්තියවේදී ආයතනයකින් පිළිගත් ආයතනයකින් ලබා ගත් සමාන සුදුසුකම්

හෝ

(03) රජයේ කාර්මික විද්‍යාලකින් ලබා ගත් ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව.

සහ

(ආ) පරිගණක සාක්ෂරතාවය (Literacy)

සහ

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක විගණනය හෝ ගිණුම්කරණය පිළිබඳ ක්ෂේත්‍රයේ එක් වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

### 04. ඖෂධ තාක්ෂණඥ (සැලසුම් සහ ප්‍රසම්පාදන) (JM 1-1) II ශ්‍රේණිය)

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යා ප්‍රථම උපාධිය

සහ

(ආ) පිළිගත් ආයතනයක සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වසරක සහතික පාඨමාලාව හදාරා තිබීම

සහ

(ඇ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඈ) රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක දේශීය / විදේශීය සැපයුම් පිළිබඳ වසරක පශ්චාත් පළපුරුද්ද.

### 05. පුද්ගලික ලේකම් - (JM 1-1) II ශ්‍රේණිය

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ "**වරලත් ලේකම්**" සහතිකය.

සහ

(ආ) මිනිත්තුවකට වචන 40 යතුරුලියන වේගයක් සහ මිනිත්තුවකට වචන 80 ක ලඝු ලේඛන වේගයක් තිබිය යුතුය.

සහ

(ඇ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඈ) රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ලේකම්කරණ කාර්ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පශ්චාත් පළපුරුද්ද.

**අභ්‍යන්තර අපේක්ෂකයින් (තනතුරු 2 , 3 , 4 , 5 සඳහා )**

01. ඉහත බාහිර අපේක්ෂකයින්හට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

02. අදාළ ක්ෂේත්‍රයේ ස්ථිර තනතුරක කළමනාකරණ සහකාර (තාක්ෂණික / තාක්ෂණික නොවන) කාණ්ඩයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05) ක සාර්ථක අඛණ්ඩ සේවයේ නියුතු රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සේවකයකු වීම.

**ඉහත තනතුරු සඳහා පොදු කරුණු (තනතුරු 2 සිට 5)**

**වැටුප් පරිමාණය** : JM-1-1- 2016 - රු. 42,600/= – 10 x 755 - 18 x 1,135 – 70,580/=

**වයස් සීමාව** : අවු. 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

අභ්‍යන්තර අපේක්ෂයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය** : ලිඛිත තරඟකාරී විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

### 06. ගබඩා පාලක තනතුර (MA 2-1) III වන ශ්‍රේණිය

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) 01. අ.පො. ස (සා.පෙළ) විභාගයේ එකවර සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව සම්මාන 04 ක් සහිතව විෂයන් 06 කින් සමත්වී තිබීම.

සහ

02. අ.පො. ස (උ.පෙළ) විභාගයෙන් (නව විෂය නිර්දේශය) විද්‍යාධාරාවේ විෂයන් දෙකකින් (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයේ හැර) සමත්ව තිබීම.

හෝ

අ.පො. ස (උ.පෙළ) විභාගයෙන් (පැරණි විෂය නිර්දේශය) විද්‍යාධාරාවේ විෂයන් දෙකකින් (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයේ හැර) සමත්ව තිබීම.

සහ

03. පරිගණක සාක්ෂරතාවය

සහ

(ආ) රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසරක පශ්චාත් පළපුරුද්ද

සහ

(ඇ) **වෘත්තීය** : තොග කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව හෝ සමාන NVQ - 5 මට්ටම සුදුසුකම් ලබා තිබීම.

### 07. තත්ව පාලන සහකාර තනතුර - (MA 2-1) - III වන ශ්‍රේණිය

**අධ්‍යාපනික/වෘත්තිය සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) 01. එක් වාරයකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව විෂයන් 4 කට සම්මාන සහිතව විෂයන් හයකින් (06) සමත්වී තිබීම

සහ

02. අ.පො.ස (උ.පෙළ) විභාගයේදී (නව විෂය නිර්දේශය) රසායන විද්‍යාව ඇතුළුව සම්මාන 2 ක් සහිතව (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) විද්‍යා විෂයන් 03 කින් සමත්ව තිබීම.

හෝ

අ.පො.ස (උ.පෙළ) විභාගයේදී (පැරණි විෂය නිර්දේශය) රසායන විද්‍යාව ඇතුළුව සම්මාන 2 ක් සහිතව විද්‍යා විෂයන් 03 කින් සමත්ව තිබීම

හා

03. පරිගණක සාක්ෂරතාවය අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

04. පිළිගත් ඖෂධ නිෂ්පාදන ආයතනයක වසර දෙකක (02) පළපුරුද්ද

(ආ) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම ඉහත (I), (II) සහ (III) සහිතව අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගනු ලැබේ.

තත්ව පාලන සහකාර තනතුරෙහි ස්ථිර සේවා නියුක්තියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අභ්‍යාසලාභී තත්ත්ව පාලන සහකාර වසර 1 ½ ක සේවාස්ථ පුහුණු කාල සීමාවක් (NVQ 5 මට්ටම සමාන) සම්පූර්ණ කර තිබීම හා ලිඛිත පරීක්ෂණ වලින් සමත්වීම පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැලකේ.

(ඇ) පුහුණුවන කාලය තුළදී දීමනාවක් ගෙවනු ලැබේ.

### 08. තාක්ෂණික සහකාර තනතුර - (MA 2-1) - III වන ශ්‍රේණිය

**අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) **අධ්‍යාපනික**

01. එක්වාරයකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, විද්‍යාව, ඉංග්‍රීසි සහ ගණිතය ඇතුළුව විෂයන් 4 කට සම්මාන සහිතව විෂයන් හයකින් (06) සමත්වී තිබීම

සහ

02. අ.පො.ස (උ.පෙළ) විභාගයේදී (නව විෂය නිර්දේශය) රසායන විද්‍යාව ඇතුළුව සම්මාන 2 ක් සහිතව (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) විද්‍යාව විෂයන් 03 කින් සමත්ව තිබීම.

හෝ

අ.පො.ස (උ.පෙළ) විභාගයේදී (පැරණි විෂය නිර්දේශය) රසායන විද්‍යාව ඇතුළුව සම්මාන 2 ක් සහිතව විද්‍යා විෂයන් 03 කින් සමත්ව තිබීම

සහ

03. පරිගණක සාක්ෂරතාවය

04. පිළිගත් විද්‍යාගාරයක වසර තුනක (03) විශ්ලේෂණ පළපුරුද්ද ලබා තිබීම.

(ආ) අභ්‍යාසලාභීන් බඳවා ගැනීම

ඉහත (i), (ii) සහ (iii) සමගාමීව පුහුණුවන්නන් බඳවා ගැනේ.

තාක්ෂණික සහකාර තනතුරෙහි ස්ථිරසේවා නියුක්තියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අභ්‍යාසලාභී තාක්ෂකණික සහකාර - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන වසර 1 ½ ක සේවාස්ථ පුහුණු කාල සීමාවක් (NVQ 5 මට්ටම සමාන) සම්පූර්ණ කර තිබීම හා ලිඛිත පරීක්ෂණ වලින් සමත්වීම පූර්ව අවශ්‍යතාවයක් ලෙස සැලකේ.

(ඇ) පුහුණුවන කාලය තුළදී දීමනාවක් ගෙවනු ලැබේ.

### 09. නඩත්තු තාක්ෂණ ශිල්පී (විදුලි / යාන්ත්‍රික/වායුසමීකරණ) තනතුර (MA-2-1 – III ශ්‍රේණිය)

**අධ්‍යාපනික/වෘත්තිය සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) 01. කාර්මික විද්‍යාලයක් විසින් පවත්වනු ලබන (NVQ – 5 මට්ටම සමාන). අදාළ ක්ෂේත්‍රයේ මෙකාට්රොනික් ඩිප්ලෝමා පාඨමාලාව

සහ

රාජ්‍ය සංස්ථාව, මණ්ඩලයක, ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර එකක (01) පළපුරුද්ද

හෝ

02. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය මගින් පවත්වනු ලබන සිව් වසරක (04) පාඨමාලාව සාර්ථකව අවසන් කොට තිබීම.

සහ

රාජ්‍ය සංස්ථාව, මණ්ඩලයක, ප්‍රසිද්ධ වාණිජ ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර දෙක (02) ක පළපුරුද්ද

**අභ්‍යන්තර අපේක්ෂකයින් (තනතුරු 6 , 7 , 8 , 9 සඳහා )**

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සේවකයකු වශයෙන්, ප්‍රාථමික ගණයේ නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු වර්ගීකරණයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි විෂයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සමත්ව වෘත්තීය සුදුසුකම් සමඟ වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඉහත තනතුරු සඳහා පොදු කරුණු (තනතුරු 6 සිට 9 දක්වා)**

**වැටුප් පරිමාණය** : MA 2.1-2016 රු. 30,310/= – 10x300 – 7x350 – 4x495 -20x660 – 50,940/=

**වයස් සීමාව** : අවු. 18 ට නොඅඩු විය යුතු අතර,අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

අභ්‍යන්තර අපේක්ෂයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය** : ලිඛිත තරඟකාරී විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**ආන්තික ප්‍රතිලාභ (තනතුරු 1 සිට 9 දක්වා)**

- පැමිණීම සහ කාර්ය සාධනය සඳහා දිරි දීමනා
- උපයෝගී කර නොගත් වාර්ෂික සහ අසනීප නිවාඩු සඳහා මුදල් ගෙවීම
- වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය සහ වෛද්‍ය වියදම් සඳහා වැය වූ මුදල්, ප්‍රතිපූර්ණය කිරීම.
- සංස්ථාව විසින් වැටුපෙන් 15% ක මුදලක් සේවක අර්ථසාධක අරමුදල (EPF) වෙත ගෙවනු ලබන අතර, සේවකයා විසින් 10% ක මුදලක් සේ. අ. අ. (EPF) වෙත දායකත්වය සපයනු ලැබේ.
- සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) සංස්ථාව විසින් වැටුපෙන් 3% දායකත්වය සපයනු ලැබේ.
- 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුකූලව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛය ප්‍රකාරව පාරිතෝෂික දීමනාව හිමිවේ.
- වෙනත් ආන්තික ප්‍රතිලාභ ද අයත් වේ.

### 10. ව්‍යාපෘති ලේකම් - (වසර 03ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත)

හොරණ, මිල්ලෑව ඉදිකිරීමට යෝජිත නව නිෂ්පාදනාගාරය සඳහා SPMC (රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ) ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ සියලු කරුණු කාරණා සඳහා ව්‍යාපෘති කාර්ය කණ්ඩායමට වගකිව යුතු වන අතර එම ව්‍යාපෘති ලේකම් තනතුර සඳහා කණ්ඩායමක් වශයෙන් මෙන්ම ස්වාධීනව වැඩ කටයුතු කිරීමට හැකියාව ඇති බහුවිධ කර්තව්‍ය දක්ෂතා ඇති ක්‍රියාශීලී ගතිපැවතුම් ඇති අයෙකු බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

**ව්‍යාපෘති ලේකම්ගේ ප්‍රධාන රාජකාරී**

- සියලුම ලිපිලේඛන ආරක්ෂිතව පවත්වාගෙන යාම.
- ලිපි ලියවිලි, ලේඛන සකස් කර පිළියෙල කිරීම හා වෙනත් අදාළ ලිපි හුවමාරු කටයුතු සිදු කිරීම.
- ව්‍යාපෘති කළමනාකරණ කමිටුව හා මෙහෙයුම් කමිටුව මගින් දෙනු ලබන හා නියම කරනු ලබන කාර්ය කර්තව්‍යයන් ඉටුකිරීමෙහිලා ව්‍යාපෘති සම්බන්ධීකාරක වෙත සහය වීම.
- රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ අවශ්‍යතාවයන්ට අනුකූලව අතිරේක හා අමතර කර්තව්‍යයන්ද පවරනු ලැබේ.

**සුදුසුකම්**

01. අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව සිටීම හෝ ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමාධාරියෙකු වීම සමඟ ලේකම් කටයුතු පිළිබඳ සහතිකලාභියෙකු වීම.

02. ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ චතුරත්වය, මනා ලිඛිත හා කථන සන්නිවේදන කුසලතා හිමිවීම, විශේෂයෙන් (කාර්යාලයීය හා ක්ෂේත්‍රයන්හිදී) රැස්වීම් වාර්තා සටහන් පිළියෙල කිරීම.

03. අන්තර් පුද්ගල කුසලතා සහ දක්ෂතා සහිත වෘත්තීයවේදීමය හා ආකර්ෂණීය පෞරුෂත්වයක් හිමි අයෙකු වීම.

04. ව්‍යාපෘති ලේකම් ධූර කාර්යභාරයක අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද.

05. MS office යෙදවුම් පිළිබඳ ප්‍රවීණයෙකු වීම. (Excel, word and Power Point)

**වැටුප** : මසකට රුපියල් 60,000/=

**බඳවා ගැනීමේ ක්‍රමවේදය** : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ව්‍යාපෘති ලේකම් තනතුර සඳහා වන ආන්තික ප්‍රතිලාභ :**

- සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) වැටුපෙන් 15% ක් වශයෙන්ද සේවකයා විසින් 10% වශයෙන්ද දායක වනු ඇත.
- සංස්ථාව විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) වැටුපෙන් 3% වශයෙන් දායකත්වය පිරිනමනු ඇත.
- වෙනත් ආන්තික ප්‍රතිලාභද හිමි වේ.

**පොදු උපදෙස් :**

නියමිත ආකෘති පත්‍රවල සකසන ලද අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා විමසුම් විස්තර සමග ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතික වල සහතික කළ පිටපත්, අයදුම්පත සමග අමුණා තිබිය යුතුය.අදාළ අයදුම්පත ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://www.spmclanka.lk වෙතින් බාගත (Download) කර ගත හැකිය.

- රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළයුතු අතර, ආයතන ප්‍රධානී විසින් අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.
- අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර, අයදුම්පත් මෙම දැන්වීම් පළවී දින 10ක් ඇතුළත, පහත සඳහන් ලිපිනයට, ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සැලැස්විය යුතුය.
- ඉහත අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවලවත්ත, රත්මලාන.**